මගේ අංකය - JSC/SEC/CIR/2021

**<u>අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 448</u>**

සියළුම කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් වෙත,

<u>කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් වෙත වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම සම්බන්ධ නිර්නායක</u>

කම්කරු විනිශ්චය සභාවන්හි පවතින නඩු කඩිනමින් විසඳා අවසන් කිරීම අධිකරණ සේවා කොමිෂන් සභාවේ අභිලාෂය වන අතර, එකී අභිලාෂය මුදුන්පත් කරවා ගැනීමේ පරමාර්ථය ඇතිව අදාල සියළු කරුණු පිළිබඳව සලකා බැලීමෙන් පසු, කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් විසින් සිය වාර්ෂික වැටුප් වර්ධක උපයා ගැනීම සඳහා වැටුප් වර්ධකයට අදාල වසරක් තුලදී ප්‍රකාශයට පත් කල යුතු හබකල නඩු වලට අදාල අවම නියෝග සංඛ්‍යාව පිළිබඳව, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණය කිරීමක් සිදු කර ඇත.

1) ඒ අනුව, වාර්ෂික වැටුප් වර්ධක උපයා ගැනීම සඳහා වාර්ෂික වැටුප් වර්ධකයට අදාල වසරක් තුල ප්‍රකාශයට පත් කල යුතු හබකල නඩුවලට අදාල <u>අවම නියෝග සංඛ්‍යාව</u> පහත සඳහන් පරිදි වේ. **<u>එම නියෝග සාක්ෂි විභාග කිරීමට ලක් වූ තරහකාරී විමසීමකින්/විභාගයකින් පසුව ප්‍රකාශයට පත්කරන ලද නියෝග පමණක් විය යුතුවේ.</u>**

| | නියමිත වැටුප් වර්ධක වර්ෂය අවසානයේදී කම්කරු විනිශ්චය සභාවේ පවතින මුළු නඩු සංඛ්‍යාව | නියමිත වැටුප් වර්ධක වර්ෂය තුලදී ප්‍රකාශයට පත් කල යුතු හබකල නඩු වලට අදාල **අවම නියෝග ගණන** |
|---|---|---|
| 01 | 1 - 100 දක්වා | (වැටුප් වර්ධක වර්ෂය අවසානයේදී අදාල කම්කරු විනිශ්චය සභාවේ පවතින මුළු නඩු ගණන) X $\frac{20}{100}$ |
| 02 | 101 - 150 දක්වා | 24 |
| 03 | 151 - 200 දක්වා | 31 |
| 04 | 201 - 250 දක්වා | 37 |
| 05 | 251 - 300 දක්වා | 42 |
| 06 | 301 - 350 දක්වා | 46 |
| 07 | 351 - 400 දක්වා | 49 |
| 08 | 400 ට වැඩි | 51 |

2) මින් ඉදිරියට ප්‍රකාශයට පත් කරනු ලබන හබකල නඩු වලට අදාල සියළුම නියෝගවල මෘදු පිටපත් (Soft Copies) අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ **ordersplt@jsc.gov.lk** යන විද්‍යුත් තැපැල් ලිපිනයට ("Word document" ආකාරයට) <u>මාසිකව</u> යොමු කල යුතුවේ.

[ඒ අනුව **2021.01.01** දින සිට මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති නියෝගවල දෘඩ පිටපත් (Hard Copies) මේ වන විටත් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාල වෙත යොමු කර ඇතත්/නැතත්, එම සියළුම නියෝගවල මෘදු පිටපත් (Soft Copies) ඉහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට නොපමාව යොමුකල යුතු අතර, මින් ඉදිරියට නියෝගවල දෘඩ පිටපත් (Hard Copies) අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත නොඑවිය යුතුවේ.]

3) ඉහත 01 හි පරිදි ප්‍රකාශයට පත් කර ඇති නියෝග සංඛ්‍යාව අනුව වාර්ෂික වැටුප් වර්ධකය උපයා ගත්තේද/නැද්ද යන්න තීරණය කිරීම සඳහා '<u>ආසන්න අවස්ථාවක් උපවය වී ඇති බවට</u>' අධිකරණ සේවා කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇති අවස්ථාවක පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

   I. වැටුප් වර්ධක වර්ෂය තුළ අවසන් කර ඇති මුළු නඩු ප්‍රමාණය (සමථ කළ නඩු ද ඇතුළුව)
   II. වැටුප් වර්ධක වර්ෂය තුළ අවසන් කර ඇති පැරණි නඩු ප්‍රමාණය
   III. වැටුප් වර්ධකයට අදාල වර්ෂය තුල ලබාගෙන ඇති නිවාඩු ප්‍රමාණය

4) පූර්ව සේවා ස්ථානයට/ස්ථානවලට අදාලව ප්‍රකාශයට පත්කල යුතුව ඇති නියෝග පැවතීම සහ වර්තමාන සේවා ස්ථානයට අදාලව තෙමසකට වඩා කල් ගතවී ඇති නියෝග පැවතීම වාර්ෂික වැටුප් වර්ධකය ලබාදීම ප්‍රතික්ෂේප කිරීමට හේතුවක් වනු ඇත. අයදුම් පත්‍රය ඉදිරිපත් කරන අවස්ථාවේ සඳහන් කර ඇති පූර්ව සේවා ස්ථානයට/ස්ථානවලට අදාල නියෝග සකසා හා යොමු කොට අවසන් කල පසු ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත වාර්තා කළ යුතුය.

5) කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් සේවය කරනු ලබන කම්කරු විනිශ්චය සභාවන්හි පවතින නඩු, ප්‍රධාන කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරයා සමඟ සාකච්ඡා කර සියළු කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන්ට අපේක්ෂිත නඩු නියෝග සංඛ්‍යාව ප්‍රකාශයට පත් කිරීමට හැකිවන අයුරින් සමානුපාතිකව බෙදා ගැනීමට පියවර ගත යුතු අතර, ඒ සම්බන්ධයෙන් යම් ගැටළුකාරී තත්වයක් උපවය වන්නේ නම් අදාල කම්කරු විනිශ්චය සභාවේ ඕනෑම කම්කරු විනිශ්චයාධිකාධිකාර සභාපතිවරයෙකුට ඒ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලිඛිතව සියළු කරුණු වාර්තා කරමින් ඉල්ලීමක් කළ හැකිය.

6) නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඔබගේ වාර්ෂික වැටුප් වර්ධක අයදුම් පත්‍රය අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 311 ප්‍රකාරව වැටුප් වර්ධක දිනයේ සිට මාස තුනක් (03) ඉක්මවීමට පෙර අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු අතර, නියමිත කාල සීමාව තුල එසේ ඉදිරිපත් නොකිරීම අදාල වැටුප් වර්ධකය ස්ථිරව විලම්භනය කිරීමට හේතු විය හැකි බවත්, එසේ ස්ථිරව විලම්භනය කෙරෙන ලද වැටුප් වර්ධක පිළිබඳව නැවත සලකා බැලීමක් නොකරනු ඇති බවත් දැනුම් දෙමි.

7) අපේක්ෂිත නඩු නියෝග සංඛ්‍යාව හෝ ඊට වඩා වැඩි නියෝග සංඛ්‍යාවක් වාර්ෂික වැටුප් වර්ධකයට අදාල කාලසීමාව තුල ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කිරීම සඳහා ඔබ විසින් ගනු ලබන පියවර සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ විශේෂ අවධානය යොමු කරන බව දන්වමි.

8) තවද මෙම චක්‍රලේඛයෙන් නියමිත අවම නියෝග සංඛ්‍යාව පාදක කර ගනිමින් කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරුන්ගේ වාර්ෂික වැටුප් වර්ධක ලබා දීම <u>2022.01.01 දින සිට</u> ක්‍රියාත්මක කරන බවද වැඩිදුරටත් දන්වමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්.එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2021 මාර්තු මස 22 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.